1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எமது இல. / My Ref. | CSS/03/06/ANN/TR/2026 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2026.08.19 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2026

දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී සේවය / කළමනාකරණ සේවා නිලධාරී සේවය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවය / රියදුරු සේවය / කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිරත නිලධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු සඳහා මා විසින් නිකුත් කරන ලද 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2026 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, උක්ත සේවාවන්හි නිරත නිලධාරීන් සම්බන්ධයෙන් 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ප්‍රධාන ලේකම් මාරු මණ්ඩලයේ නිර්දේශ මත සකස් කරන ලද මාරු මණ්ඩල තීරණ ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියට මුදා හැර ඇති අතර එම මාරු මණ්ඩල තීරණ ලැයිස්තුවෙහි නම් සඳහන් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් **2026.10.07 දින සිට** ක්‍රියාත්මක කරන ලෙස මෙයින් නියෝග කරමි. තව ද, වෙනත් කරුණු යටතේ ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය විශේෂයෙන් සඳහන් කර ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු අදාළ දිනයේදී ක්‍රියාත්මක කරන ලෙස ද වැඩිදුරටත් නියෝග කරමි.
(දිගුව : https://www.cs.sp.gov.lk/css/csw/transfer_si.html)

| ඇමුණුම | සේවය |
|---|---|
| I | සංවර්ධන නිලධාරී සේවය |
| II | කළමනාකරණ සේවා නිලධාරී සේවය |
| III | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සේවය |
| IV | රියදුරු සේවය |
| V | කාර්යාල සේවක සේවය |
| VI | අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය |

03. එසේම, 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2026 හි ඡේද අංක 18 හි දක්වා ඇති පරිදි ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට වාර්තා කර සති 02 කට පසු ක්‍රියාත්මක කළ යුතුය.

04. තවද, මෙම ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳව අදාළ නිලධාරීන්ට කල් ඇතිව දැනුම් දී නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද දන්වමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2222603
කාර්යාලය / அலுவலகம் / Office: 091 4119011, 091 2234052
091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk
එස්.එච්. දහනායක මාවත, ගාල්ල. S.H. Dahanayaka Mawatha, Galle. எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"ඩිජිටල් නවෝත්පාදනයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක්"

05. එමෙන්ම, ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා ගත නොහැකි අතර, නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අදාළ නිලධාරීන් නිදහස් කිරීම ඔබගේ වගකීම වන බව ද අවධාරණය කරමි.

06. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් කිසියම් නිලධාරියෙකු අභියාචනා ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම්, අංක 01/2026 හා 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛයේ ආකෘති අංක 03 ප්‍රකාරව අභියාචනා අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර, අදාළ <u>ආසන්නතම ආයතන ප්‍රධානියාගේ පමණක් නිර්දේශය සහිතව **2026.09.07** දින හෝ ඊට පෙර, සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලයේ තැපැල් අංශය වෙත අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන්</u> යොමු කළ යුතුය. (ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''2026 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා'' ලෙස සඳහන් කළ යුතුය. නිසි නිල මඟින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

07. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලය විසින් සලකා බැලීමට කටයුතු නොකරන බව අවධාරණය කරන අතර <u>අභියාචනා අයදුම්පත්‍රය</u> (ඇමුණුම VI ) මේ සමඟ ඉදිරිපත් කර ඇත.

08. තවද, මා විසින් නිකුත් කරන ලද 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2026 ප්‍රකාරව 2026 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) මුදා හැර ඇති බැවින්, එම තීරණවල දෘඪ පිටපත් කිසිදු ආයතනයකට යොමු නොකරන අතර ඔබ යටතේ පවතින සියලුම ආයතනවල සේවය කරන අදාළ නිලධාරීන් වෙත 2026 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත්:-

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය - දැ.ගැ.ස.
02. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන), ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත - දැ.ගැ.ස.

ආකෘති අංක 03

**දකුණු පළාත් සභාව**

**<u>2026 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමේ අයදුම්පත්‍රය</u>**

| **සේවය :-** | **පන්තිය හා ශ්‍රේණිය :-** | **ස්ථාන මාරු අයදුම්පත් අංකය :-** | **අභියාචනා අයදුම්පත් අංකය :-** |
|---|---|---|---|

| | |
|---|---|
| 01. සම්පූර්ණ නම | |
| 02. ස්ථාන මාරු ලේඛනයේ සඳහන් නම | |
| 02.1 ජාතික හැඳුනුම්පත් අංකය | |
| 03. ස්ථිර ලිපිනය | |
| 04. තාවකාලික ලිපිනය | |
| 05. දුරකථන අංකය (පෞද්ගලික) | |
| 06. වර්තමාන නිත්‍ය සේවා ස්ථානය | |
| 06.1 අනුයුක්ත කර ඇත්නම් එම සේවා ස්ථානය | |
| 07. අයත් අමාත්‍යාංශය | |
| 08. 2026.06.30 දිනට වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය | |
| 09. 2026.06.30 දිනට සේවා කාලය | |
| 10.1 වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය | |
| 10.2 ස්ථාන මාරු ලේඛනයේ අනු අංකය | |
| 10.2.1 ස්ථාන මාරු අයදුම්පත් අංකය | |
| 10.3 ඔබ සමඟ ස්ථාන මාරු කරනු ලබන අනුප්‍රාප්තිකයා / අනුප්‍රාප්තිකයන්ගේ නම් | |

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

| | |
|---|---|
| 11.1 අභියාචනා මගින් ඉල්ලුම් කරන වෙනත් සේවා ස්ථාන - 01 | |
| 11.2 අභියාචනා මගින් ඉල්ලුම් කරන වෙනත් සේවා ස්ථාන - 02 | |
| 11.3 අභියාචනා මගින් ඉල්ලුම් කරන වෙනත් සේවා ස්ථාන - 03 | |

| | |
|---|---|
| 12. අභියාචනා ඉදිරිපත් කිරීමට හේතු | |

| | |
|---|---|
| 13. වෙනත් කරුණු | |

| | |
|---|---|
| 14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය | |

**අභියාචනා අයදුම්පත සම්පූර්ණ කරන ලද්දේ** **:-** (අත්සන හා දිනය)

**අභියාචනා නිර්දේශ කරන ලද්දේ** **:-** (ආයතන ප්‍රධානියාගේ අත්සන, නිල මුද්‍රාව හා දිනය)

(ඉහත 14 කොටසේ ආයතන ප්‍රධානියා වශයෙන් සඳහන් වන්නේ අභියාචනාකරු සේවය කරන ස්ථානයේ ආසන්නතම අධීක්ෂණ මාණ්ඩලික නිලධාරියා වේ. දෙපාර්තමේන්තු ප්‍රධානී, අමාත්‍යාංශ ලේකම් යනාදී ලෙස නිසි නිල මගින් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත